# විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
## விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு
## Ministry of Science and Technology

| | | |
|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | දිනය<br>திகதி<br>Date **2025.09.18** |

**ප්‍රවෘත්ති කර්තෘ / අධ්‍යක්ෂ**

**<u>ප්‍රවෘත්ති නිවේදනය</u>**

**ශ්‍රී ලංකාවේ තුන්වන නැනෝ චන්ද්‍රිකාව ලබන 19 දා කක්ෂගත කෙරේ…**

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ මූලිකත්වය ඇතිව ශ්‍රී ලාංකික ඉංජිනේරුවරුන්ගේ තාක්ෂණික දායකත්වයෙන් නිර්මාණය වූ තුන්වන නැනෝ චන්ද්‍රිකාව ලබන සැප්තැම්බර් 19 වන දා කක්ෂගත කිරීමට නියමිතය. “BIRDS-X DRAGONFLY“ නමින් නම් කර ඇති මෙම නැනෝ චන්ද්‍රිකාව පසුගිය අගෝස්තු 24 වනදා නාසා ආයතනය විසින් දියත් කළ “SPX33“ රොකට් මෙහෙයුම මගින් ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානය වෙත රැගෙන යන ලද අතර, එය හෙට දින (19 දා) ශ්‍රී ලංකා වේලාවෙන් පස්වරු 2.15ට ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ සිට එහි කක්ෂය වෙත මුදා හැරීමට නියමිත අතර එම අවස්ථාව **නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ දී සජීවීව නැරඹීමට හැකියාව ඇති බව එම ආයතනය පවසයි.**

2019 වසරේදී ශ්‍රී ලංකාවේ පළමු නැනෝ චන්ද්‍රිකාව ලෙස “රාවණ-1“ චන්ද්‍රිකාවත්, 2022 වසරේදී ජාත්‍යන්තර පාර්ශ්වයන් 05ක සහභාගිත්ව යෙන් යුතු තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතියක් තුළින් නිර්මාණය කරන ලද දෙවන චන්ද්‍රිකාව ලෙස “KITSUNE“ චන්ද්‍රිකාවත් අභ්‍යවකාශ ගත කිරීමෙන් අනතුරුව, මෙරට තුන්වන නැනෝ චන්ද්‍රිකාව ලෙස අභ්‍යවකාශ ගතවන “BIRDS-X Dragonfly“ පර්යේෂණ නැනෝ චන්ද්‍රිකාව ශ්‍රී ලංකාවේ අභ්‍යවකාශ තාක්ෂණ සංවර්ධන ගමන් මගෙහි තවත් සුවිශේෂී ජයග්‍රහණයක් සනිටුහන් කරයි. මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකාවෙන් කිසිදු ප්‍රාග්ධන පිරිවැයක් වැය නොවීම මෙහි එක් සුවිශේෂී කරුණකි.

ජපන් අභ්‍යවකාශ පර්යේෂණ ආයතනය (JAXA) හා ඩිජිටල් රේඩියෝ සන්නිවේදන ආයතනය (ARDC) යන ජාත්‍යන්තර ආයතනවල සහයෝගීතාව සහිතව, ආතර් සී. ක්ලාක් ආයතනය සහ ජපානයේ “KYUSHU“ තාක්ෂණ ආයතනය මගින්, අභ්‍යවකාශ තාක්ෂණ සහයෝගීතා ව්‍යාපෘතියක් ලෙස මෙය ක්‍රියාත්මක කර තිබේ.

විදේශීය පාර්ශ්වයන්ගේ එකඟතාවය ලබා ගනිමින්, මෙරට පාර්ශ්වයෙන් මෙම ව්‍යාපෘතිය දියත් කිරීම සඳහා ආතර් සී ක්ලාක් ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු (ආචාර්ය) සනත් පනාවැන්නගේ, හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ මෙහෙයුම්) ඉංජිනේරු කමනි එදිරිවීර සහ සන්නිවේදන ඉංජිනේරු අංශයේ අධ්‍යක්ෂ ඉංජිනේරු කවින්ද්‍ර ජයවර්ධන මහත්ම මහත්මීන්ගේ මගපෙන්වීමෙන් එම ආයතනයේ පර්යේෂණ ඉංජිනේරුවන් වන තරිඳු දයාරත්න, කවීන්ද්‍ර සම්පත්, උදිත ගයාන් සහ තිළිණ විජේබණ්ඩාර යන මහත්වරුන් දායක වී තිබේ.

**නිත්‍යා සිල්වා**
**ගරු විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමාගේ**
**මාධ්‍ය ලේකම්**

3 වන මහල, "සෙත්සිරිපාය" 1 වන අදියර, බත්තරමුල්ල.
3வது தளம், "செத்சிறிபாய" கட்டம் 1, பத்தரமுல்லை.
3rd floor, "Sethsiripaya" Stage I, Battaramulla.

කාර්යාලය / காரியாலயம் / Office
☎ (+9411) 2879410
(+9411) 2879412
motrdevelopment@gmail.com
www.mostr.gov.lk